**13. ගාථාව**

**"අප්පමත්තෝ අයං ගන්ධෝ - යා'යං තගරචන්දනී,**
**යෝ ච සීලවතං ගන්ධෝ - වාති දේවේසු උත්තමෝ'ති.**

**පදගතාර්ථය**

| | | |
|---|---|---|
| **තගරචන්දනී** | - | තුවරලා හා සඳුන් පිළිබඳ |
| **යෝ අයං ගන්ධෝ** | - | යම් මේ සුවඳක් වේ ද |
| **අප්පමත්තෝ** | - | ස්වල්පමාත්‍ර යි. (ඉතා ම ටිකයි) |
| **සීලවතං** | - | සිල්වතුන්ගේ |
| **යො ච ගන්ධෝ** | - | යම් සිල් සුවඳක් වේ ද, (ඒ සුවඳ) |
| **උත්තමෝ** | - | උතුම් වූයේ |
| **දේවේසු** | - | දෙව්ලොවෙහි ද දෙවියන් අතර ද |
| **වාති** | - | හමයි. |

**භාවාර්ථය**

තුවරලා-සඳුන්වල යම් සුවඳක් වේ ද එය ඉතා ස්වල්පමාත්‍ර වෙයි. සිල්වතුන්ගේ උතුම් වූ සුවඳ දෙවියන් අතර ද පැතිරෙයි.

**නිදන කථාව**

රජගහ නුවර වේළුවනාරාමයෙහි බුදුරජාණන් වහන්සේ වැඩවසන කල්හි, මහාකාශ්‍යප තෙරුන් වහන්සේ නිරෝධසමාපත්තියට සමවැද ඉන් නැගිට රජගහ නුවර පිඩු සිගා යම්'යි එහි වැඩි සේක.

එදවස සක්දෙව් රජුගේ පරිචාරිකා වූ පරවියන්ගේ පා වැනි පා ඇති පන්සියයක් දෙවඟනෝ තෙරුන් දැක "පිණ්ඩපාතය පිළිගන්වමු" යි බත් බඳුන් පන්සියයක් ද රැගෙන අවුත් අතරමග රැක සිට " ස්වාමීන් වහන්ස! අපගේ මේ දනය පිළිගනු මැනවැ"යි ආරාධනා කළහ. "තෙපි යව, මා යන්නේ දුප්පතුන්ට සංග්‍රහ කරන්නැ" යි තෙරුන් වහන්සේ වදළ කල්හි "ස්වාමීනි! අප නො නසන්න, අපගේ මේ දනය පිළිගන්නැ" යි නැවත නැවතත් ඉල්ලූහ.

තෙරණුවෝ ඇඟිලි තුඩු එකතු කොට අසුරක් ගැසූහ. අසුර ගැසූ හඬ අසා බියපත් වූ දෙවඟනෝ එහි සිටින්නට අපොහොසත් ව දෙව්ලොවට ම පලා ගියහ.

දෙවඟනන් දෙව්ලොවට ගොස් ඒ බව සක් දෙවිඳුට සැළකළහ. "තෙපි කවර සැටියෙන් ගියහු දැ"යි සක් දෙව් රජ ඇසී ය. "දේවයන් වහන්ස! අප ගියේ මේ සැටියෙන් ම ය. අමුතු වෙස්වලා නො ගත්තෙමු" යි කීහ.

ශක්‍ර තෙමේ "මම බත් පිළිගන්වමි" යි කියා මහලු වෙසක් මවා ගෙන සුජාතා අසුර කන්‍යාවනුත් එසේ මැහැලි වෙස් ගන්වා ගෙන, එක් පේසකාර වීදියක් මවා එහි නූල් කටිමින් හුන්නේ ය. මහකසුප් තෙරණුවෝ "දුප්පතුන්ට සංග්‍රහ කරමි" යි නුවර බලා වඩින සේක්, ඒ මහලු-මැහැලි දෙදෙනා දැක මේ නුවර මොවුන්ට වැඩි දුප්පතුන් ඇති විය නො හැකි යැ'යි සිතා ඔවුන්ගේ ගෙට පිඩු පිණිස වැඩියහ.

ඔවුහු මහාකාශ්‍යප තෙරුන්ට දිව්‍යමය දන් පිළිගැන්වූහ. ඒ භෝජනයෙහි සුවඳ මුළු නුවර පුරා ම පැතිරිණ. එවිට තෙරුන් වහන්සේ පරීක්ෂා කරන සේක්, එම් ශක්‍රයා නියාව දැන "නුඹ කළේ ලොකු වරදෙකි. ලොකු අපරාධයකි. දුප්පතුන්ගේ සැපත උදුරා ගැනීම කවර තරම් අයුතු ද? එය දෙවිකමට තබා මිනිස්කමටවත් නො හොබී. අනුන්ගේ දේ පැහැර ගැනීම තිරිසන්කමකි. දුප්පතාගේ ගුණ නො සලකන්නා තිරිසනාටත් වඩා පහත් ය. නුඹට නම් යස ඉසුරෙන් අඩුවෙක් නැත. එසේ තිබිය දී දුප්පතාට ලැබෙන්න තිබූ යහපත උදුරා ගැනීම මහත් සැහැසිකමෙක් ය. දුප්පත් කෙනෙකුන් මට අද දනක් දුන්නේ නම් ඔහුට සෙනෙවි තනතුරක් හෝ සිටු තනතුරක් ලැබෙනු ඒකාන්ත ය. නුඹ කළේ දරුණු අපරාධයෙකි. මින් ඉදිරියට මෙවැනි වැඩ නො කළ මැනවැ" යි වදළ සේක.

සක් දෙව්රජ, "මට ද පින් උවමනා වේ" යැ'යි කියා "මහාකාශ්‍යප රහතන් වහන්සේට දුන් දනය උතුම් දනයකැ"යි ප්‍රීතිවාක්‍යය කියමින් දෙව්ලොවට ගියේ ය.

විහාරයෙහි වැඩසිටි සම්බුදුරජාණන් වහන්සේ ඒ හඬ අසා "මහණෙනි! බලවු, සක් දෙව්රජ උදන් අනමින් අධිකතර සන්තෝෂයෙන් අහසින් යන සැටි"යි කියා වදළ විට "ස්වාමීනි! මෙසේ ප්‍රීතිවාක්‍ය කියමින් අහසින් යෑමට ඔහු කළේ කුමක් ද" යි කියා භික්ෂූන් වහන්සේලා ඇසූහ. "මාගේ පුත් මහාකාශ්‍යප තෙරුන්ට පිණ්ඩපාතයක් දී ඉන් ලැබෙන විපාකය මහත් බව දැන ප්‍රීතිවාක්‍ය කියායි" යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදළ සේක. "ස්වාමීනි! දෙව්ලොව සිටි ශක්‍ර තෙමේ මහකසුප් තෙරුන්ට දෙන පිණ්ඩපාතයෙහි විපාක මහත් බව කෙසේ දැන ගත්තේ ද"යි භික්ෂූන් ඇසූ විට "මහණෙනි! මහාකාශ්‍යප වැනි වූ පිණ්ඩපාතයෙන් ජීවත්වන්නාහට දෙවියෝ, මනුෂ්‍යයෝ, යක්ෂයෝ ප්‍රිය කෙරෙති" යි වදළ බුදුරජාණන් වහන්සේ "තමන් පෝෂණය කරන, අනුන් පෝෂණය නො කරන, සන්සුන් ඉඳුරන් හා දුරු කළ කෙලෙස් ඇති, සිහි ඇති පිණ්ඩපාතික භික්‍ෂුවට දෙවියෝ කැමති වෙති" යන අර්ථවත් මේ ප්‍රීතිවාක්‍යය වදළ සේක.

**"පිණ්ඩපාතිකස්ස භික්ඛුනෝ - අත්තභරස්ස අනඤ්ඤපෝසිනෝ**
**දේවා පිහයන්ති තාදිනෝ - උපසන්තස්ස සදා සතිමතෝ"**

මෙම ප්‍රීතිවාක්‍ය වදළා වූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍ර මාගේ පුතුගේ සිල් සුවඳින් පැමිණි පිණ්ඩපාතය දුන්නේ ය"යි "**අප්පමත්තෝ අයං ගන්ධෝ**" යන ගාථාව වදළ සේක.

මෙම ධර්මදේශනාව අවසානයෙහි බොහෝදෙනා සෝවාන් ඵලාදියට පැමිණියෝ ය. දේශනාව මහජනයාට වැඩ සහිත විය.

**ආත්මෝපදේශය** - ඔබ කරන පින සොරුන්ට පැහැර ගත නො හැකි ය.

සාධු ! සාධු !! සාධු !!!

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**(දුරුතු 2552)**

**සම්පාදක:** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසි
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

**පිටු සැකසීම:** පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

**ධර්මදානය:** පින්වත් ආර්. ඩී. දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්‍ෂා පියරංගිකා මෙණෙවිය විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිස හා තමාට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්‍ද්‍රයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2009**